**ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය - 2022**

**-------------------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය ( මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක  සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවයමෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයාගැනීමේදී වංචා හෝ වැරදි  හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරුකිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි  සැලැසුම්  කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන්  සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝඅභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසාවන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇතිබව සහ හෙළිදරව්කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මණ්ඩලය ක්‍රියාකර ඇති බව,

- සියබලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූල නොවීම

| | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022 දෙසැම්බර් 31 දිනට පොත්වල අගය ශූන්‍ය වූ පිරිවැය රු.මිලියන 65.04 ක් වූ විද්‍යාත්මක උපකරණ අයිතම 223 ක් තවදුරටත් භාවිතා කරමින් පැවති අතර, ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 65 ඡේදය ප්‍රකාරව එම වත්කම්වල ඵලදායි ජීවිතකාලය වාර්ෂිකව සමාලෝචනය කර, අපේක්ෂා කරන තත්ත්වයන් ඇස්තමේන්තුවලින් වෙනස් වන්නේ නම් එම වෙනස්කම් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කළ යුතු වුවද, එසේ කටයුතු කර නොතිබුණි. | අගය ශූන්‍ය වූ වත්කම් අතරින් විද්‍යාත්මක උපකරණ ප්‍රත්‍යාගණන කටයුතු සිදුකරමින් පවති. ස්ථාවර වත්කම් ලේඛණය හා ප්‍රත්‍යාගණන කල උපකරණ ලැයිස්තුව සැසදීමේ දී හදුනාගැනීමට අපහසු වූ උපකරණ හදුනාගැනීම සඳහා කමිටුවක් පත් කර කමිටු නිර්දේශ මත ඉදිරි කටයුතු කිරීමට පියවර ගෙන ඇත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | පූර්ව කාලපරිච්ඡේද වැරදි අතීතානුයෝගී ලෙස නැවත ප්‍රකාශ කිරීම නිසා පූර්ව වර්ෂයේ විගණිත මූල්‍ය ප්‍රකාශනවල රේඛීය අයිතමයන් 7 ක් රු.මිලියන 2,065.4 කින් ප්‍රතිශෝධනය කර තිබුණද, එම ප්‍රතිශෝධිත අයිතමයන් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව අවශ්‍ය හෙළිදරව්කිරීම් සිදුකර නොතිබුණි. | 2023 වසරේදී එම වරද නිවැරදි කරගන්නා බව දැනුම් දෙමි. | -එම- |
| (ඇ) | සමාලෝචිත වර්ෂය අවසානයට පැවති අක්‍රීය උපකරණ අයිතමයන් | 2022 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයේදී හදුනාගත් අළුත්වැඩියා කලයුතු, විශ්‍රාම | -එම- |

| | | | |
|---|---|---|---|
| | 475 ක් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව්කර නොතිබුණි. | ගැන්විය හැකි අයිතමයන් ප්‍රදර්ශණ කටයුතු සඳහා භාවිතයට ගතහැකි සහ ඉවත්කල යුතු අයිතම පිළිබඳව අදාල මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කරමින් පවතින අතර එම කටයුතු අවසන් වූ පසුව මූල්‍ය ප්‍රකාශන වල හෙලදරව් කිරීමට කටයුතු කරනු ලැබේ. | |
| (ඇ) | මණ්ඩලය වෙත සමාලෝචිත වර්ෂයේදී ලැබී තිබුණු රු.මිලියන 12.2 ක විදේශ ප්‍රදාන සහ රු.මිලියන 9.83 ක භාණ්ඩාගාර ප්‍රාග්ධන ප්‍රදාන සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 11 හි 106 සහ 107 පරිච්ඡේද ප්‍රකාරව අවශ්‍ය හෙළිදරව්කිරීම් සිදුකර නොතිබුණි. | 2023 වසර අවසන් ගිණුම් පිළියෙළ කිරීමේදී නිවැරදි කර ගන්නා බව දැනුම් දෙමි. | -එම- |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | විදේශ ව්‍යාපෘතියක් මගින් ඉදිකර මාර්ග සංවර්ධන අධිකාරිය විසින් 2019 වර්ෂයේදී මණ්ඩලය වෙත භාර දී තිබුණු රු.මිලියන 81.48 ක් වටිනා මධ්‍යගත විකිරණශීලී අපද්‍රව්‍ය ගබඩාව, ඊට අයත් භෞතික ආරක්ෂණ පද්ධතියේ පවතින අයිතම 83 ක් සහ 2017 වර්ෂයේදී විදේශ ආධාර ලෙස ලැබී තිබුණු රු.මිලියන 1.6 ක් වටිනා විකිරණ මිනුම් උපකරණයක් අගය කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | එම ගොඩනැගිල්ලේ වටිනාකම පිළිබඳව මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ලිඛිතව දැනුම් දී ඇත්තේ 2023.05.23දිනය. විකිරණ මිනුම් උපකරණය සම්බන්ධව ගිණුම් ගත කිරීමට අවශ්‍ය ප්‍රමාණවත් තොරතුරු නොමැති බැවින් මේ සම්බන්ධව සොයා බලා ඉදිරියේදී ගිණුම් ගත කිරීමට හෝ මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කිරීමට පියවර ගනු ඇත. | මණ්ඩලය විසින් භාවිතා කරනු ලබන වත්කම්වල වටිනාකම් අගය කර මූල්‍ය ප්‍රකාශනවල දැක්වීම/හෙළිදරව් කිරීම කළ යුතුය. |
| (ආ) | කොබෝල්ට් 60 මූලද්‍රව්‍ය ආනයනය කිරීමට අදාළ රේගු සටහන්කරය අනුව සමාලෝචිත වර්ෂය අවසානයට ගෙවිය යුතු රේගු ගාස්තුව රු.මිලියන 34.34 ක් වුවත් එය රු.මිලියන 30.28 ක් ලෙස දැක්වීම හේතුවෙන් ජංගම වගකීම් රු.මිලියන 4.06 කින් අඩුවෙන් දක්වා තිබුණි. | කොබෝල්ට් 60 මූලද්‍රව්‍ය ගබඩා කර තිබූ හිස් භාජන ප්‍රති-අපනයනයේදී ගෙවිය යුතු රේගු ගාස්තුව රු.මිලියන 4.06 දෝෂ සහිත බැවින් ගිණුම්ගත නොකල අතර එය නිරාකරණය කර 2023 වර්ෂයේ ගිණුම්ගත කිරීමට කටයුතු කරනු ඇත. | වැරදි නිවැරදි කර නිවැරදි රේගු ගාස්තුව ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | කොබෝල්ට් 60 මූලද්‍රව්‍ය ක්ෂය වෙන් කිරිම ඉකුත් වර්ෂයේදී | ශ්‍රී ලංකා ගැමා මධ්‍යස්ථානයෙන් ලද තොරතුරු පදනම් කරගෙන කොබෝල්ට් | නිවැරදි ක්ෂය ප්‍රමාණයන් |

| | | | |
|---|---|---|---|
| | රු.මිලියන 4.69 කින් ද සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 6.9 කින්ද අඩුවෙන් ගණනය කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට ක්ෂය ප්‍රතිපාදනය රු.මිලියන 11.59 කින් අඩුවෙන් දක්වා තිබුණි. | 60 මූලද්‍රව්‍යයේ ක්ෂය වියදම ගිණුම් ගත කර තිබූ අතර මේ වනවිට නිවැරදි ක්ෂය වියදම හඳුනාගෙන ඇති බැවින් 2023 වර්ෂයේ ගිණුම් වලට ගැලපීමට කටයුතු කරනු ලැබේ. | හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | සේවාදායක ආයතන 119 ක් වෙත කුලී පදනමින් නිකුත් කර තිබුණු තාප සංදීප්ත විකිරණ මිතිකමාන කාඩ්පත් ( TLD ) 2,762 ක් අගය කර වත්කම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | මෙම TLD කාඩ්පත් වල ඵලදායී ජීවිත කාලය තක්සේරු කිරීම අපහසු බැවින් ස්ථාවර වත්කමක් ලෙස ගිණුම් ගත කිරීමට ආයතනය තීරණය කර නොමැත. 2023 වර්ෂයේ සිට ඉහත කුලී පදනම මත ලබා දී ඇති TLD කාඩ්පත් සඳහා තොග ගිණුමක් හා තොග පාලන ගිණුමක් ගිණුම් අංශය යටතේ පවත්වාගෙන යාමට පියවර ගෙන ඇත. | සාධාරණ වටිනාකම් අගය කර වත්කම් ලෙස ගිණුම්ගත කළ යුතුය. |
| (ඉ) | 2021 වර්ෂයේ මිලදීගෙන තිබුණු රු.මිලියන 120.7 ක් වටිනා කොබෝල්ට් 60 මූල ද්‍රව්‍යය භාවිතා කර අවසන් වීමේදී අපහරණය සඳහා අවශ්‍ය වියදම් වෙනුවෙන් ප්‍රතිපාදන වෙන්කිරීමක් සිදුකර නොතිබුණි. | ප්‍රතිඅපනයනය සඳහා වියදම් ඇස්තමේන්තු කර 2023 මූල්‍ය ප්‍රකාශන වල අවශ්‍ය අරමුදල් ප්‍රතිපාදනය සඳහා කටයුතු කරමි. | අපහරණ කටයුතු සඳහා අවශ්‍ය වියදම් වෙනුවෙන් ප්‍රතිපාදන වෙන්කිරීම කළ යුතුය. |
| (ඊ) | නව කැළණි පාලම ඉදිකිරීම් ව්‍යාපෘති ඒකකය විසින් 2021 දෙසැම්බර් 31 දිනට එම ව්‍යාපෘතිය සඳහා පිළියෙල කර තිබුණු මූල්‍ය ප්‍රකාශන අනුව රු. මිලියන 0.89 ක් වටිනා පරිගණක, ගෘහභාණ්ඩ සහ කාර්යාලීය උපකරණ මණ්ඩලයෙන් ලැබී තිබුණද මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන වලින් එම වත්කම් ඉවත් කර නොතිබුණි. | දැනට මෙම කරුණු සනාථ කිරීමට අප මණ්ඩලය සතුව තොරතුරු නොමැති බැවින් කැළණි පාලම ඉදිකිරීම් ව්‍යාපෘති භාරව තිබූ අමාත්‍යාංශයෙන් මේ සම්බන්ධව විමසීමක් සිදුකර ඒ අනුව ඉදිරි කටයුතු සිදුකරනු ලැබේ. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිකර ගැනීමට පියවර ගත යුතුය. |
| (උ) | ඉකුත් වර්ෂ වලදී හා සමාලෝචිත වර්ෂයේදී ලැබී තිබූ රු.මිලියන 2.43 ක මාර්ගගත තැන්පතු මුදල් ආදායම් ශීර්ෂ හඳුනාගත නොහැකි වීම හේතුවෙන් හඳුනාගත නොහැකි තැන්පතු ලෙස ජංගම වගකීම් යටතේ දක්වා තිබුණි. | තැන්පත් සනාථ කිරීම සඳහා අදාල තොරතුරු සේවාලාභීන් ලබානොදීම නිසා මෙම තැන්පතු අදාල වර්ෂයේදීම හඳුනාගත නොහැකි වී ඇති අතර 2023.07.06 දින වන විට මෙම තැන්පතු අතරින් රු.1,380,455.71 වටිනා තැන්පතු හඳුනාගෙන ඇත. ඉතිරි මුදල් ද හඳුනාගැනීමට හැකි සෑම පියවරක්ම ගනිමින් ඇත. | මාර්ගගත ලැබීම් නිවැරදිව හඳුනාගැනීමට හැකි වන පරිදි අදාල පද්ධතිය වැඩිදියුණු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඍ) | සමාලෝචිත වර්ෂයේදී විද්‍යාත්මක උපකරණයක අලුත්වැඩියා වියදම රු.මිලියන 3.28ක් ප්‍රාග්ධනිත කර තිබුණද ඊට අදාල ක්ෂය වෙන්කිරීම රු. මිලියන 0.16 ක් අඩුවෙන් දක්වා තිබුණි. | 2023 වර්ෂයේදී නිවැරදි කරනු ලැබේ. | ක්ෂය වෙන්කිරීම් නිවැරදිව ගණනය කර ගිණුම් ගත කළ යුතුය. |

**1.6 නීතිරීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයෙහි 12.2.6. වගන්තිය | වැඩබැලීමේ වැටුප ගෙවීම සඳහා අදාල අමාත්‍යාංශයේ ලේකම්ගේ අනුමැතිය ලබාගත යුතු වුවත් මණ්ඩලය විසින් එවැනි අනුමැතියකින් තොරව 2020 වර්ෂයේ සිට නිළධාරීන් 5 දෙනෙකු වෙනුවෙන් වැඩබැලීමේ වැටුප් ලෙස රු.මිලියන 2.41 ක් ගෙවා තිබුණි. | වැඩ බැලීම සඳහා වැටුප් ගෙවීමට අදාලව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලැබී ඇත.තවද මෙම දීමනා ගෙවීම් සඳහා අමාත්‍යාංශය මඟින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු අනුමැතිය ඉල්ලුම් කලද අමාත්‍යාංශ අතිරේක ලේකම් පාලන විසින් මෙම වැඩ බැලීම් සඳහා දීමනා ගෙවීම් අනුමත කර නොමැති බව දන්වා එවා ඇත. | ආයතන සංග්‍රහයේ විධි විධාන ප්‍රකාරව කටයුතු කළ යුතු අතර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත නොකරන ලද ගෙවීම් අත්හිටුවීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 371 (2) ආ සහ (5) | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ නිර්දේශය සහිතව භාණ්ඩාගාරයේ පූර්ව අනුමැතිය ලබා ගැනීමකින් තොරව මාණ්ඩලික නොවන නිලධාරීන්ට අවස්ථා 16 කදී රු.100,000 මුල්‍ය සීමාව ඉක්මවා එකතුව රු.මිලියන 2.74ක් ගෙවා තිබුණි. තවද අවස්ථා 9 කදී ලබා ගත් එකතුව රු. මිලියන 0.26 ක අත්තිකාරම් මුදල් අදාල කාර්යය සඳහා වැය කිරීමකින් තොරව අග්‍රිම නිකුත් කල දින සිට දින 14 සිට දින 79 දක්වා අතර කාලයක් අත රඳවාගෙන තිබුණි. | එවකට රට තුළ පැවති ඉන්ධන හිඟය හේතුවෙන් ඕනෑම ඉන්ධන හලකින් ඉන්ධන ලබාගැනීම සඳහා මුදල් අත්තිකාරම් ලබා දෙන ලදී. තවද ඉන්ධන මිල ඉහල ගිය බැවින් රු.100,000ට වඩා වැඩි අත්තිකාරම් ලබාදීමට සිදුවිය. කෙසේ වුවත් ඉදිරියේ දී මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කිරීමටත් අභ්‍යන්තර පාලන ක්‍රමවේද ශක්තිමත් කිරීමටත් කටයුතු කරමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | 1994 අප්‍රේල් 20 දිනැති අංක 30/94 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය | සමාලෝචිත වර්ෂය තුළ එකතුව රු.මිලියන 14.16 ක් වූ විදේශ ප්‍රදාන ලැබීම් මහා භාණ්ඩාගාරය හරහා ලබා නොගෙන සෘජුවම මණ්ඩලය වෙත ලබා ගෙන තිබුණි. | විදේශ සම්පත් දෙපාර්තමේන්තුව හරහා විදේශ ව්‍යාපෘති වලට අදාල විදේශ ආධාර ලබාගැනීම සඳහා ක්‍රමවේදයක් මේ වන විට සකස් කරමින් පවතී. | චක්‍රලේඛ විධි විධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඈ) | 2018 දෙසැම්බර් 31 දිනැති අංක 04/2018 දරන වත්කම් කළමනාකරණ චක්‍ර ලේඛය මඟින් නිකුත් කර ඇති මාර්ගෝපදේශය | මූල්‍ය නොවන වත්කම් වර්ෂ පහකට වරක් තක්සේරු කළ යුතු වුවත් මණ්ඩලය සතු පිරිවැය රු.මිලියන 3,245 ක් වූ මූල්‍ය නොවන වත්කම් එසේ තක්සේරු කර නොතිබුණි. | විද්‍යාත්මක උපකරණ ප්‍රත්‍යාගණන කටයුතු සිදු කරමින් පවතින අතර ස්ථාවර වත්කම් ලේඛණය හා ප්‍රත්‍යාගණන ලේඛණය අතර ඇති වෙනස්කම් සැසඳීම සඳහා කමිටුවක් පත්කර ඇති අතර කමිටු නිර්දේශ මත ඉදිරි කටයුතු සිදු කරනු ලැබේ | -එම- |

**2 මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.මිලියන 19.47 ක ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.මිලියන 129.49 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.මිලියන 148.96 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මුළු ආදායම රු.මිලියන 121.4 කින් අඩුවීම මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3 මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කලමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2014 අංක 40 දරන ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති පනතේ 4 (එ) වගන්තිය ප්‍රකාරව මණ්ඩලය විසින් ශ්‍රී ලංකාව ඇතුලත පිහිටි විකිරණශීලී ඛණිජ සම්පත්වල පැවැත්ම ගවේශණය කිරීම සිදුකල යුතු අතර 4 (අ) වගන්තිය ප්‍රකාරව ජාතික සංවර්ධනය සඳහා අදාල විකිරණශීලී ඛනිජ ද්‍රව්‍ය උපයෝගී කරගත යුතු වුවත් මණ්ඩලය විසින් විකිරණශීලී ඛනිජ ද්‍රව්‍ය ජාතික සංවර්ධනය සඳහා යොදාගත හැකි ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි. | IAEA හි තාක්ෂණික සහයෝගිතා ව්‍යාපෘතියක් (SRL/02/009) යටතේ භූ විද්‍යා හා පතල් කාර්යාංශය සමඟ එක්ව රට තුළ පවතින ස්වභාවික විකිරණශීලී ප්‍රභව පිළිබඳ අධ්‍යයනයක් සිදු කර ඇත. මෙහිදී භූ විද්‍යා හා පතල් කාර්යාංශයේ නිලධාරීන්ට අවශ්‍ය තාක්ෂණික දැනුම ලබා දී ඇති අතර එමගින් අවශ්‍ය උපකරණ කට්ටල ද ලබා දී ඇත. රට තුළ පවතින ස්වභාවික සම්පත් පිළිබඳ තොරතුරු රැස් කිරීම එම කාර්යාංශයට භාර වී ඇති බැවින් ඊට අවශ්‍ය වන න්‍යෂ්ටික තාක්ෂණය සම්බන්ධ දැනුම පරමාණුක බලශක්ති මණ්ඩලය විසින් මේ වන විටත් සපයා | පනතේ විධිවිධාන ප්‍රකාරව විකිරණශීලී ඛනිජ ද්‍රව්‍ය සඳහා අගය එකතු කිරීම මඟින් ඒවා ජාතික ආර්ථිකයට උපරිම වාසියක් ගෙනදෙන අයුරින් භාවිතා කළ හැකි ක්‍රමවේදයන් සකස්කිරීම සඳහා අවශ්‍ය පර්යේෂණ සිදුකළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | ඇත. එබැවින් ඔවුන්ට ඉදිරියේ දී එම සමීක්ෂණ කටයුතු පහසුවෙන් සිදුකරගත හැකි මට්ටමක් උදාවී ඇත. විකිරණ නිරීක්ෂණ සඳහා RPTS අංශය විසින් තාක්ෂණික සහාය ලබා දුන් අතර මාතලේ, පල්ලේගම, දඹුල්ල සහ ඇලහැර ප්‍රදේශයන් ආවරණය කරන ලදී. තවද කවුඩුපැල්ලේල්ල, නාඋල සහ ඇළහැර ප්‍රදේශවල හඳුනාගත් ඉහළ පසුබිම් ප්‍රදේශවල ස්ථානගත ගැමා මිනුම් සිදු කර ඇත. | |
| (ආ) | ගැමා මධ්‍යස්ථානයේ මෙහෙයුම් සඳහා අවශ්‍ය කොබෝල්ට් 60 මූලද්‍රව්‍ය වර්ෂ 4 කට වරක් ප්‍රතිසම්පාදනය කළ යුතු අතර, ඒ සඳහා 2013 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා රු.මිලියන 358 ක පමණ රජයේ ප්‍රදාන ලබා දී තිබුණි. මහා භාණ්ඩාගාරයට වැය බරක් නොවන පරිදි ගැමා මධ්‍යස්ථානයේ ස්වකීය ආදායම් උපයෝගී කරගෙන ක්ෂය වන මූලද්‍රව්‍ය ප්‍රතිසම්පාදනය කරගත හැකි පරිදි ආයෝජනයක් සහිත අරමුදල් කළමනාකරණ වැඩසටහනක් ක්‍රියාත්මක නොවීමෙන් අනාගතයේදී අරමුදල් සපයාගැනීම දුෂ්කර විය හැකි බව නිරීක්ෂණය විය. | අදහස් දක්වා නොතිබුණි. | භාණ්ඩාගාර ප්‍රදාන ලබාගැනීමකින් තොරව ස්වකීය ආදායම් මත මූලද්‍රව්‍ය ප්‍රතිසම්පාදනය කරගැනීම සඳහා වන ක්‍රියාමර්ග ගත යුතුය |
| (ඇ) | මණ්ඩලය විසින් නාගරික සංවර්ධන අධිකාරියෙන් බදු පදනමට ලබාගෙන තිබුණු ප්‍රධාන කාර්යාලය පිහිටි ඔරුගොඩවත්ත පිහිටි ඉඩම නව කැළණි පාලම ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා පවරාගෙන තිබුණි. පසුව නාගරික සංවර්ධන අධිකාරිය විසින් ශ්‍රී ලංකා ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු අධිකාරියට බදු දී තිබූ වෙනත් ඉඩමක ව්‍යාපෘතිය හරහා නව ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලක් ඉදිකරවා ගෙන තිබුණු අතර 2023 ජූනි වන විටත් අදාළ ඉඩම නීත්‍යානුකූලව මණ්ඩලය වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | මාළබේ ඉඩම වෙනුවෙන් මිලියන 181 ක් ගෙවා ඇති අතර එම අවස්ථාවේදී පැරණි ඉඩමෙහි භුක්ති නොවිඳි කාලයට අදාල බදු කුලිය අයකර ගැනීමට කටයුතු කර නොමැති බැවින් ඒ සම්බන්ධව නාගරික සංවර්ධන අධිකාරිය වෙත මෙන්ම මාර්ග සංවර්ධන අධිකාරිය වෙතද ලිඛිතව දැනුම් දීම් කරමින් මණ්ඩලයට ලැබිය යුතු වන්දි මුදල ලබා ගැනීමට කටයුතු කරමින් ඇත. මේ සම්බන්ධව අදාල අමාත්‍යාංශ නිලධාරීන්ගේ ප්‍රධානත්වයෙන් අදාල ආයතනවල නිලධාරීන්ද සමග සාකච්ඡාවන් පැවැත්වුවද මෙතෙක් පැහැදිලි ප්‍රතිචාරයක් ලැබී නොමැත. මේ පිළිබඳව රේඛීය අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ උපදෙස් පරිදි අදාල අමාත්‍යාංශ ලේකම්වරුන් සමඟ | අදාළ ඉඩම කඩිනමින් මණ්ඩලය වෙත පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| | සාකච්ඡාවක් කැඳවීම සඳහා ඉල්ලුම් කරමින් 2023.01.30 දිනැති ලිපිය අමාත්‍යාංශය වෙත යොමු කර ඇත.<br>මෙම ගැටළුව සම්බන්ධව 2023 මැයි මස 08 දින පැවති පාර්ලිමේන්තු ආංශික අධීක්ෂණ කාරක සභා රැස්වීමේදීද දන්වන ලදුව එම කමිටුවට එම ගැටළුව යොමු කරන ලෙස ලබාදුන් උපදෙස් අනුව ඊට අදාල වාර්තාවක් එම කමිටුව වෙත යොමු කර ඇත. | |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති පනතේ 5 (ඉ) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකාව තුල පුද්ගල විකිරණ මාත්‍රාමිතික සේවය (TLD) සැපයීමේ ඒකාධිකාරී ආයතනය පරමාණුක බලශක්ති මණ්ඩලය වේ. ශ්‍රී ලංකාව තුල විකිරණ තාක්ෂණය භාවිතාකරන (වෛද්‍ය සහ කාර්මික) බලපත්‍රලාභී ආයතන 600 ක් පමණ පවතින බව පරමාණුක බලශක්ති නියාමන සභාවේ බලපත්‍ර පරීක්ෂාවේදී විගණනයට නිරීක්ෂණය විය.නමුත් මණ්ඩලය විසින් සේවා සැපයීම සිදුකර ඇත්තේ ඉන් ආයතන 206 ක් සඳහා පමණි. ඒ අනුව බලපත්‍රලාභී ආයතන 400 ක් සඳහා මණ්ඩලය සේවා සැපයීමෙන් ලබාගත හැකි ආදායම් උපයාගැනීමට අපොහොසත් වී තිබුණි. | මණ්ඩලය සමඟ එම සේවාව සඳහා මෙතෙක් ලියාපදිංචි වී නොමැති බලපත්‍ර සම්බන්ධයෙන් සභාපතිවරුන් මට්ටමින් සාකච්ඡා කිරීමට ලිඛිතව ඉල්ලීම් කර ඇති අතර සේවා ලබා නොගන්නා ආයතන පිළිබඳ තොරතුරු ලිපියක් මගින් සභාව දැනුවත් කිරීමට කටයුතු කර ඇත.<br>මෙයට අමතරව මණ්ඩලය මගින් එම සේවාව ලබා නොගන්නා සෑම ආයතනයක් වෙතම ලිපි යොමුකර ඇත. මේ පිළිබඳව තවදුරටත් නියාමන සභාව සමඟ සාකච්ඡා කර ඉදිරි පියවර ගැනීමට මණ්ඩලය කටයුතු කරමින් සිටී. | නියාමන සභාව හා සම්බන්ධීකරණය වෙමින් සියළු බලපත්‍රලාභීන් සඳහා විකිරණ මාත්‍රා මිතික සේවය ලබාදීමට කටයුතු කළ යුතුය. |

## 3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපළ පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කොන්ක්‍රීට් පරික්ෂාව සඳහා නිසි අධ්‍යයනයකින් තොරව 2018 පෙබරවාරි රු.මිලියන 1.66 කට මිලදී ගෙන තිබුනද මණ්ඩලය සතුව සම්පීඩක යන්ත්‍රයක් (crusher) නොමැතිවීම හේතුවෙන් Concrete Core Drilling උපකරණය මිලදී ගත් දින සිට 2023 ජුලි වන විටත් නිෂ්කාර්යව පැවතුණි. | 2019 වසරේ සිට රට තුල පැවති ආර්ථික අස්ථාවරත්වය නිසා එම උපකරණය තවමත් මිලදී ගැනීමට නොහැකි වී ඇත. | ඵලදායීව උපයෝජනය කිරීම සඳහා උචිත ක්‍රියාමාර්ග ගත යුතුය. |

### 3.4 මතභේදයට තුඩුදෙන ගණුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය ඉදිකිරීම සඳහා තෝරා ගත් මාලඹේ ඉඩම සඳහා මුදල් ගෙවීමේදී, 2014 පෙබරවාරි 24 දිනැති අංක 14/0277/526/002 දරන අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව මණ්ඩලය පවත්වාගෙන ගිය පැරණි ගොඩනැගිල්ල පිහිටි ඔරුගොඩවත්ත ඉඩම වෙනුවෙන් නාගරික සංවර්ධන අධිකාරියට ඉදිරියට ගෙවා තිබූ බදු කුලිය වූ රු. මිලියන 7.66 ක් අඩු කර ගෙවිය යුතු වුවත්, එසේ අඩුකර ගෙවීම් සිදුකර නොතිබුණි. එසේම මාලඹේ ඉඩමේ වෙළඳ පොළ වටිනාකම රු.මිලියන 116 ක්ද, අවුරුදු 30 ක් සඳහා බදු වටිනාකම රු. මිලියන 75.5 ක්ද වූ රජයේ තක්සේරුව නොසලකා නාගරික සංවර්ධන අධිකාරියට මාළඹේ ඉඩම වෙනුවෙන් 2015 වර්ෂයේදී රු.මිලියන 181 ක් ගෙවා තිබුණි. | මේ සම්බන්ධව නාගරික සංවර්ධන අධිකාරිය වෙත මෙන්ම මාර්ග සංවර්ධන අධිකාරිය වෙතද ලිඛිතව දැනුම් දීම් කරමින් මණ්ඩලයට ලැබිය යුතු වන්දි මුදල ලබා ගැනීමට කටයුතු කරමින් ඇත. මේ පිළිබඳව රේඛීය අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ උපදෙස් පරිදි අදාල අමාත්‍යාංශ ලේකම්වරුන් සමඟ සාකච්ඡාවක් කැඳවීම සඳහා ඉල්ලුම් කරමින් 2023.01.30 දිනැති ලිපිය අමාත්‍යාංශය වෙත යොමු කර ඇත. මෙම ගැටළුව සම්බන්ධව 2023 මැයි මස 08 දින පැවති පාර්ලිමේන්තු ආංශික අධීක්ෂණ කාරක සභා රැස්වීමේදීද දන්වන ලදුව එම කමිටුවට එම ගැටළුව යොමු කරන ලෙස ලබාදුන් උපදෙස් අනුව ඊට අදාල වාර්තාවක් එම කමිටුව වෙත යොමු කර ඇත. | 1. අමාත්‍ය මණ්ඩල තීරණ ප්‍රකාරව කටයුතු කළ යුතු අතර රජයේ තක්සේරුව අනුව පමණක් ගෙවීම් සිදුකල යුතුය.<br>2. මණ්ඩලයට අයවිය යුතු මුදල් අයකරගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.5 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මණ්ඩලය සඳහා නිල වෙබ් පිටුවක් නිර්මාණය සහ සංවර්ධනය කිරීම සඳහා 2020 ජනවාරි 8 සිට ක්‍රියාත්මක ගිවිසුම ප්‍රකාරව අදාල කාර්යයන් දින 90 ක් තුල නිමකල යුතු වුවත් 2023 සැප්තැම්බර් වන විටත් අදාල කාර්යය අවසන් කර නොතිබුණි. එසේ වුවත් 2022 මාර්තු වන විට ගිවිසුම්ගත සම්පූර්ණ මුදල වූ රු.450,000 ක් ගෙවා තිබුණි. තවද ගිවිසුම් කාලය දීර්ඝ කර බවට විගණනයට සාක්ෂි නොවුණු අතර රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 5.4.4 ප්‍රකාරව අත්තිකාරම් සුරක්ෂණයක් ලබා නොගෙන රු.45,000 ක් අත්තිකාරම් ගෙවා තිබුණි. එසේම ගිවිසුමේ කොන්දේසි අංක 18 ප්‍රකාරව අයකල යුතු රු.45,000 ක ප්‍රමාද ගාස්තු අයකර නොතිබුණි. | ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය සඳහා නිල වෙබ් පිටුවක් නිර්මාණය සහ සංවර්ධනය කිරීම සඳහා Cyber Concept Pvt Ltd ආයතනය වෙත රු.450,000.00 කට ප්‍රදානය කර ඇති අතර 08.01.2020 දින සිට ක්‍රියාත්මක වන පරිදි ගිවිසුම් සකස් කර කටයුතු කළද රටේ පැවති කොරෝනා වසංගතය හේතුවෙන් අදාල කාලය තුල නිම කිරීමට අපහසු වුවද දෙපාර්ශවයේම එකඟතාවයෙන් කටයුතු කළ බැවින් ප්‍රමාද ගාස්තු අයකර නොමැත. | ගිවිසුම් කාලය තුල අදාල කාර්යයන් ඉටුකරවා ගත යුතු අතර රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන් හා ගිවිසුම් කොන්දේසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |